විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති එකමුතුව.
பல்கலைக்கழக தொழிற் சங்கங்களின் ஒன்றியம்.
University Trade Unions Alliance.

2022/05/10

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 18
වෝඩ් පෙදෙස
කොළඹ 07

**<u>අවිහිංසාවාදී නිර්පාක්ෂික අරගලයට එල්ල කළ මැර ප්‍රහාරය හෙළා දකිමු.</u>**

දිවයිනේ තරුණ තරුණියන් ගාලු මුවදොර ආරම්භ කළ නිර්පාක්ෂික අරගලයට පැවැති රජය 2022 මැයි 09 වන දින එල්ල කළ මැර ප්‍රහාරය දිවයිනේ දේශපාලනික වශයෙන් කලු පැල්ලමක් සනිටුහන් කර ඉතිහාසගත වී ඇත.

නිදහස් රටක භාෂණයේ අයිතිය ජනතාව සතු පරම අයිතියකි. දිවයිනේ පවතින සමාජීය, ආර්ථික හා දේශපාලනික අස්ථාවරභාවය පදනම් කරගනිමින් පවතින ක්‍රමයේ වෙනසක් සොයමින් සිටින ගාලු මුවදොර ආදරයේ අරගලයට අදට දින 32 ක් ගත වී ඇත. ඒ ආදරණීය තාරුණ්‍යය දිවා රෑ ගාලු මුවදොර දෙවනත් කරමින් සිටිනුයේ ඔවුන් වෙනුවෙන්ම නොව සමස්ත වැඩ කරන ජනතාව වෙනුවෙනි. එම සාමකාමී අරගලයට එල්ල වූ මැර ප්‍රහාරය හමුවේ අද වන විට සිදු වෙමින් පවතින ජීවිත හා දේපළ විනාශය පිළිබඳ දිවයින පත්ව ඇති බේදනීය තත්ත්වයට රාජ්‍ය ත්‍රස්තවාදය වගකිව යුතුය.

සාමකාමී නිරායුධ ආදරයේ අරගලයට එල්ල කළ රාජ්‍ය ත්‍රස්තවාදී මැර ප්‍රහාරය හෙළා දැකීමට මේ වන විට දිවයින තුළ පනවා ඇති ඇඳිරිනීතිය අවසන් වූ පැයේ සිට ඉදිරියට පැය 48 ක් 2022 මැයි 12 දින පෙරවරු 7.00 සිට 2022 මැයි 14 වන දින පෙරවරු 7.00 දක්වා, (යම්හෙයකින් රජයේ ඇඳිරිනීතිය දීර්ඝ කළහොත් එය අවසන් වන පැයේ සිට ඉදිරියට වැඩ කරන පැය 48ක්) සංකේත වැඩ වර්ජනයක් දියත් කිරීමට 2022 මැයි මස 10 වන දින Zoom තාක්ෂණය ඔස්සේ රැස්වූ විශ්විද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සමිති ඒකමතිකව තීරණය කරන ලද බව මෙයින් දන්වමු.

මෙයට
පහත සඳහන් වෘත්තීය සමිති එකමුතුවේ නියමය පරිදි,

සමන්ත ප්‍රියදර්ශන
සභාපති
අන්තර් විශ්වවිද්‍යාලයීය උපශාලාධිපතිවරුන්ගේ සංගමය

අ. පි. බ.



එම්. ජී.එම්. පීරිස්
සභාපති
සමගි සේවක සංගමය





විජයසිංහ ජයතිලක
සභාපති

කපිල ජයසිංහ
ලේකම්

අන්තර් විශ්වවිද්‍යාලයීය සේවා වෘත්තීය සමිතිය



ඒ. එම්. හර්ෂපාල බණ්ඩාර
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය





(පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත/එම්.ඩී. දාබරේරා)
සම සභාපතිවරු

(ජනක විමලසූරිය/ පී.කේ. රුවන් කුමාර)
සමලේකම්වරු

විශ්වවිද්‍යාල වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව
(ස්වාධීන වෘත්තීය සමිති 18 කින් සමන්විතය)

පිටපත් ඃ

1. ලේකම්තුමා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම්තුමා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
3. විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්/ආයතන අධ්‍යක්ෂවරුන්/ මණ්ඩාධිපතිවරුන්/ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ලේඛකාධිකාරීවරුන්/ නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්